# නිවේදනය

ගරු මන්ත්‍රීවරුනි, පාර්ලිමේන්තුවේ ගණපූරණය නොමැතිවීම හේතුවෙන් අදාළ දිනයන්ට නියමිතව තිබූ පාර්ලිමේන්තුවේ වැඩකටයුතු පවත්වාගෙන යාමට නොහැකිව පාර්ලිමේන්තුව කල් තැබීමට සිදුවූ මෑත කාලීන අවස්ථා කිහිපයක් සම්බන්ධයෙන් සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දැඩි අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

පාර්ලිමේන්තුවේ දෛනික ප්‍රධාන වැඩකටයුතු අතර රජයේ අමාත්‍යාංශයන්හි විවිධ කාරණයන්ට අදාළව පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත්, නොයෙක් අණ පනත් යටතේවූ නියෝග, නියමයන්, රෙගුලාසි, ගිවිසුම්, සහ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව යටතේ යෝජනා සම්මතයන් වැනි වැදගත් සහ නිශ්චිත කාල රාමුවක් තුළදී පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා ඉදිරිපත් කරනු ලබන ව්‍යවස්ථාදාක කටයුතු ඇතුළත් වන බවත්, එසේම, එවැනි ව්‍යවස්ථාදායක කාර්යයන් පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම සඳහා පාර්ලිමේන්තු රැස්වීම් වෙනුවෙන් දෛනිකව විශාල මහජන මුදල් ප්‍රමාණයක් වැය කරනු

ලබන බවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස ඔබ සැම ඉතා හොඳින් දන්නා කරුණකි.

එබැවින්, මෙලෙස ඉතා විශාල මහජන මුදලක් දෛනිකව වැය කරමින් රටේ අයවැය හා මූල්‍ය ප්‍රතිපත්තිය සහ රටේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමෙහිලා අත්‍යඅවශ්‍ය වන්නාවූ පාර්ලිමේන්තු ක්‍රියාවලිය පාර්ලිමේන්තුවේ ගණපූරණය නොමැතිවීම නිසා අක්‍රීයවීමට ඉඩදීම ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයක් බව සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ  අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

එබැවින්, පාර්ලිමේන්තුව තුළ ගණපූරණය පවත්වාගැනීම ආණ්ඩු පාර්ශ්වයේ මෙන්ම විරුද්ධ පාර්ශ්වයේ සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ ව්‍යවස්ථාදායක වගකීමක් බව අවධාරණය කරන අතර ඉදිරියේදී පාර්ලිමේන්තුවට පැමිණ එවැනි කණගාටුදායක තත්ත්වයන් මතු නොවන ආකාරයෙන් කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.